# කොවිඩ්-19 ව්‍යාප්තිය වළක්වමින් පොදු මහජන සහ වෘත්තිය ක්‍රියාකාරකම් සිදුකරන ආකාරය පිළිබඳව උපදෙස්

පොදු මහජන සහ වෘත්තීය ක්‍රියාකාරකම් සඳහා උපදේශ සටහන් ලබා දී ඇත. සංචාරක සේවා, විශාල සාප්පු සංකීර්ණ, උත්සව කළමනාකරණය වැනි සමහර අංශවලට උපදෙස් සටහන් කිහිපයක් අදාළ වේ.

මෙම උපදෙස් කාර්යයන් නැවත ආරම්භ කිරීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ලබා දී ඇති සමස්ත අවසරයට යටත් වේ (මුළුමනින්ම / තෝරාගත්).

සෑම උපදෙස් සටහනක්ම සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශයේ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කරනු ලබයි. කොවිඩ්-19 සම්ප්‍රේෂණය වැළක්වීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග ආයතන හිමිකරු / වගකිවයුතු පුද්ගලයා වෙත ඉදිරිපත් කර ඇත.

වෘත්තීය ක්‍රියාකාරකම් සඳහා වැඩිදුර තොරතුරු ලබා ගැනීමට - කරුණාකර

http://eohfs.health.gov.lk/occupational/index.php?option=com_content&view=article&id=61&Itemid=208&lang=en වෙත යොමු වන්න.

නව ජීවන රටාවක් උදෙසා
புதிய வாழ்க்கை முறையை நோக்கி
TOWARDS A NEW NORMAL

සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය

World Health Organization Sri Lanka

රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය

ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව

## 19.ආගමික ස්ථාන

පන්සල්, ක්‍රිස්තියානි/කතෝලික පල්ලි, මුස්ලිම් පල්ලි සහ කෝවිල් ඇතුළු, බැතිමතුන් විසින් වන්දනා කිරීම සඳහා පැමිණෙන ස්ථාන, ආගමික ස්ථාන යටතට ගැනේ. ආගමානුකූල ක්‍රියාකාරකම්, මානසික සහනයක් ලබාදෙන බව සලකනු ලැබුවද, මේ හා සම්බන්ධ බොහෝ සිරිත් විරිත්; දුරස්ථභාවය, දෑත් වල සනීපාරක්ෂාව සහ විශබීජහරණයට අදාළ වන තාක්ෂණික ක්‍රමවේදයන්ට අනුකූලව පවත්වාගෙන යාම අපහසු විය හැකි බැවින්, ආගම හා සම්බන්ධ වන සියළුම එක්-රැස්වීම් සඳහා නැවත දැනුම් දෙන තුරු අවසර ලබාදෙනු නොලැබේ.

**විශේෂිත උපදෙස්**

සියලුම ආගමික කටයුතු සාමාන්‍ය COVID-19 වැළැක්වීමේ මාර්ගෝපදේශයන්ට අනුකූල විය යුතුය.

**පූජ්‍ය පක්ෂය / සංවිධායක / භාරකරු**

- පූජනීය ස්ථානවල මංගල උත්සව හැරුණු කොට වෙනත් සාමූහික ක්‍රියාකාරකම් හා රැස්වීම්වලට අවසර ලබාදෙනු නොලැබේ (මංගල උත්සව පිලිබඳ උපදෙස් මාලාව බලන්න). පුද්ගලයන් 5 දෙනෙකුට වඩා වැඩිපුර එක්-රැස්වන කිසිදු ආකාරයක විශේෂ යාච්ඤාවන් හෝ භෞතිකව එක්-රැස්වන ක්‍රියාකාරකම් (පෙරහැර, යාච්ඤා මෙහෙයන්, රැස්වීම්, අල් කුර්ආන් පාරායනය, එක්ව ආහාර ගැනීම් වැනි) ආගමික ස්ථානයන්හි හෝ පෞද්ගලික පරිශ්‍රයන්හි පැවැත්විය යුතු නැත. වන්දනාකරුවන් 5 දෙනෙකුට වඩා අඩු වන අවස්ථාහිදීද ඔවුන් එකිනෙකා අතර අවමයෙන් මීටර-1ක පරතරයක් පවත්වාගත යුතුය.
- පරිශ්‍රයට ඇතුළු වන ස්ථානයේ අත් සේදීමේ පහසුකම් සැපයීම සහ වන්දනාකරුවන් ඇතුළු වීම පාළනය කිරීම සඳහා එක් ගේට්ටුවක් පමණක් විවෘතව තැබීම.
- සංවරණය සීමා කරන ලද ප්‍රදේශවල, නැවත දැනුම් දෙන තුරු සියළුම පූජනීය ස්ථාන වසා තැබිය යුතුය.
- කිසියම් ස්වාමීන්වහන්සේ නමක / පූජකතුමෙකු / මවුලවිතුමෙකු / පූජකතුමියක හෝ ආගමික ස්ථානයක සේවයේ නියුතු යමෙකු අසනීප තත්වයකින් පෙළෙන්නේනම් හෝ COVID-19 යැයි සැක කළ හැකි රෝග ලක්ෂණ පෙන්නුම් කරයි නම්, ඔහු / ඇය වෛද්‍ය උපදෙස් පිළිපැදිය යුතු වේ. එවැනි අවස්ථාවකදී ඔවුන් කිසිවිටෙකත් මහජනයා හා සමීපවන ආකාරයේ කටයුතුවල නොයෙදිය යුතුවේ.
- යම් අවස්ථාවක, ආගමික පරිශ්‍රයන් වෙත බැතිමතුන් ඇතුළු වීම පාළනය සඳහා අවශ්‍යනම්, ප්‍රදේශයේ පොලීසියේ සහාය ලබගත යුතුවේ.
- නිතිපතා පැවැත්වුණ යාච්ඤා මෙහෙයන්, නැවත දැනුම්දෙනතුරු නොපැවැත්විය යුතුය.
- සියළුම බැතිමතුන් ආගමික පරිශ්‍රයන් තුළදී මුහුණු ආවරණ පැළඳිය යුතුය.
- ස්වාමීන්වහන්සේ / පූජකතුමන් මහජනතාව සමග සමීපවන අවස්ථාවන්හීදී මුහුණු ආවරණ පැළඳිය යුතුවේ.
- තමාගේ නිවෙස් තුළදී ආගමික කටයුතුවල යෙදීමට බැතිමතුන් දිරිමත් කරන්න.
- හැකි සෑම අවස්ථාවකදීම, බැතිමතුන්ගේ සහභාගීත්වය සඳහා විද්‍යුත් ක්‍රම භාවිතා කරමින් යාච්ඤා මෙහෙයන් විකාශනය කළ හැකිය.
- දානමය කටයුතු පන්සල් තුළදී / ආගමික ස්ථානවල වලදී, පවුලේ සීමිත සංඛ්‍යාවකගේ සහභාගිත්වයෙන්, සිදු කළයුතුය. ඉන් අනතුරුව පැවැත්වෙන පුණ්‍යානුමෝදනා / පූජා කටයුතු, දුරස්ථභාවය පවත්වාගනිමින් සිදු කළ යුතු අතර කෙටි කාලයකින් නිම කිරීම යෝග්‍ය වේ. මෙවැනි අවස්ථාවලදීද දෑත් සේදීමේ පහසුකම් සියළු දෙනා වෙත සපයා තිබිය යුතුය.
- වැඩි පිරිසක් එක්-රැස්වීමට හා ආහාර බෙදා හදාගෙන අනුභව කිරීමේ අවස්ථා වැඩි බැවින්, පිරිත් පිංකම්, ධර්ම දේශනා, හින්දු දෙවි දේවතාවුන් වෙනුවෙන් සිදු කෙරෙන පුද පූජා වැනි කටයුතු අවශ්‍ය අනුමැතිය ලබාදෙන තෙක් නොපැවැත්විය යුතුය. පරිශ්‍රයේ හෝ ඉන් පිටත බැතිමතුන් අතර ආහාර බෙදා නොගත යුතු අතර ශුද්ධ ජලය, පූජනීය / ආශීර්වාද ලත් ආහාර, කැඳ ආදිය බෙදා හැරීමෙන් වැළකී සිටිය යුතුය.
- පල්ලියේ දිව්‍ය සත්ප්‍රසාදය ලබාදීමේදී පූජකවරුන්ට දිව්‍ය සත්ප්‍රසාදවහන්සේ හෙවත් පූපය සත්ප්‍රසාදලාභීන්ගේ දිවෙහි තැබීම වෙනුවට අතට බෙදා දීමට උනන්දු කරනු ලැබේ. මෙම දිව්‍ය සත්ප්‍රසාද ලබාදීමේදී, සියළුම පූජකවරුන් මුහුණු ආවරණ පැළඳිය යුතුය. මෙහිදී වයින් බෙදාදීම සිදු නොකළ යුතුය.
- පන්සල, ක්‍රිස්තියානි / කතෝලික පල්ලිය, මුස්ලිම් පල්ලිය හෝ කෝවිල් කුඩා පිරිසකට හෝ රැස්විය හැකි ස්ථානයක් නොවිය යුතු බව තරයේ අවවාද කළ යුතුය.
- නායක හිමිවරුන්ගේ / ප්‍රධාන පූජකවරුන්ගේ රැස්වීම් දුරස්ථභාවය ආරක්ෂා කරගනිමින් පැවැත්විය යුතුය.
- ලබා දී ඇති උපදෙස් වලට අනුකූල බව දක්වමින් ඔබ විසින් එකඟතා ප්‍රකාශය පිරවිය යුතුය. සම්පූර්ණ කරන ලද එකගතා ප්‍රකාශයේ මුල් පිටපත ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිවරයා වෙත යැවිය යුතුය. එහි පිටපතක් අදාළ පළාත් පාලන ආයතනයට (මහ නගර සභාව / නගර සභාව / ප්‍රාදේශීය සභාව) යැවිය යුතු

අතර තවත් පිටපතක් තමන් සතුව තබා ගත යුතුය. ඉහත මාර්ගෝපදේශ දැඩි ලෙස පිළිපැදීම සහතික කිරීම නායක ස්වාමින්වහන්සේ/ ප්‍රධාන පූජකවරයාගේ වගකීම වේ.

**මහජනතාව / බැතිමතුන්**

- ඔබේ සහ පවුලේ ආරක්ෂාව සඳහා නිවසේදී ආගමික වතාවත් සිදු කරන්න.
- පල්ලිය මගින් ඉදිරිපත් කරන්නේනම්, යාච්ඤාවන්, රූපවාහිනියෙන් හෝ අන්තර්ජාලය භාවිතයෙන් ලබා ගත හැකිය.
- දාන ශාලාවන් වෙත ඇතුළුවන සෑම විටෙකදීම ඔබගේ දෑත් හොඳින් සෝදාගන්න. දානමය කටයුතු පන්සල් තුළදී / ආගමික ස්ථානවල වලදී, පවුලේ සීමිත සංඛ්‍යාවකගේ සහභාගීත්වයෙන්, සිදු කළයුතුය. ඉන් අනතුරුව පැවැත්වෙන පුණ්‍යානුමෝදනා / පූජා කටයුතු, දුරස්ථභාවය පවත්වාගනිමින් සිදු කළ යුතු අතර කෙටි කාලයකින් නිම කිරීම යෝග්‍ය වේ. අවශ්‍යනම්, දානය පූජා කිරීම සඳහා දෙදෙනෙකු පමණක් සහභාගී කරවියහැකි අතර ස්වාමීන්වහන්සේලා වැඩි ප්‍රමාණයක් සහභාගී වේනම්, එසේ වැඩිවන සෑම ස්වාමීන්වහන්සේ පස් නමකට තව එක අයෙක් බැගින් වැඩියෙන් සහභාගී කරවිය හැකිය.
- ඔබ ආගමික ස්ථානයකට ඇතුළු වන්නේ නම් සෑම විටම මුහුණු ආවරණයක් පැළඳ ගන්න, සියල්ලන් සමඟ මීටරයක දුරක් පවත්වාගන්න, අත් සේදීමකින් තොරව මුහුණ ස්පර්ශ නොකරන්න.
- ඔබ කිසියම් පූජාවක් ගෙනයන්නේනම්, ඒවා සෑම විටම ඔබේම භාජනයක රැගෙන යන්න. නැවත නිවෙස වෙත පැමිණි විගස එම භාජන සබන් යොදා හොඳින් සෝදන්න.
- පල්ලියේ දිව්‍ය සත්ප්‍රසාදය ලබාගැනීමේදී දිව්‍ය සත්ප්‍රසාදවහන්සේ හෙවත් පූපය තම අතට ලබාගෙන පසෙකට වී එය ගෞරවාන්විතව, ඉක්මනින් පරිභෝජනය කරන්න. සත්ප්‍රසාදලාභීන් මේ අවස්ථාවේ වෙනත් කිසිවක් ස්පර්ශ නොකළ යුතුය.
- ආගමික ස්ථානයේ හැකි අවම කාලය ගත කරන්න. අනෙකුන් සමඟ කතාබස් කරමින් පරිශ්‍රයෙහි නිකරුණේ කාලය ගත නොකරන්න.
- දෑත් එක්කොට ආයුබෝවන් කීම, අත වනා ආචාර කිරීම, හිස නවා අචාර කිරීම හෝ පපුවෙහි අත තබා ආචාර කිරීම වැනි එකිනෙකා ස්පර්ශ කිරීම අවශ්‍ය නොවන සංස්කෘතික හා ආගමික වශයෙන් අනුමත කරන ලද සුබ පැතුම් භාවිතා කරන්න.
- වර්තමාන තත්වයන් යටතේ වන්දනා ගමන් සහ ආගමික ස්ථාන නැරඹීම දැඩි ලෙස අධෛර්යමත් කරනු ලැබේ. ඒ වෙනුවට, නැවත දැනුම් දෙන තුරු ඔබේ නිවස ආසන්නයේම ඇති පූජනීය ස්ථානයට ඔබගේ පවුලේ සාමාජිකයන් සමඟ පමණක් පැමිණෙන ලෙස ඔබට උපදෙස් දෙනු ලැබේ.

**නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා උපදෙස්**

- පාරිශ්‍රයේ පිවිසුම් හා පිටවීමේ ස්ථානවල පෝස්ටර් ප්‍රදර්ශනය කිරීම.
- ජනමාධ්‍ය ප්‍රකාශ.
- සමාජ මාධ්‍යන්හි ඉදිරිපත් කෙරෙන ප්‍රකාශ.
- ශ්‍රී ලංකාවේ සියලුම ආගමික ප්‍රධානීන්ට ලිපි මගින් දැනුම්දීම.
- පූජනීය ස්ථානවලට පැමිණෙන සංඛ්‍යාව සීමා කිරීමේදී සහාය වීම සඳහා නීතිය ක්‍රියාත්මක කරන අංශ වෙත දැනුම් දීම.
- එක් එක් ආයතනයෙහි දායක සභා / භාරකාර මණ්ඩල විසින් ප්‍රජාවට පූර්වාරක්ෂක පිළිවෙත් පිළිපැදීම සඳහා අවශ්‍ය උපදෙස් ලබා දිය යුතුය.
- ශබ්ද විකාශන යන්ත්‍ර භාවිතයෙන් ප්‍රදේශයේ නිවේදනයන් නිකුත් කළ හැකිය.

**වැඩිදුර අදහස්:**

සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද පහත සඳහන් මාර්ගෝපදේශ වෙත යොමු වන්න:

1) COVID-19 පැතිරීම පාලනය කිරීම සඳහා වෙසක් උත්සවය අතරතුර ගත යුතු පියවර.

2) COVID-19 පාලනය කිරීම සඳහා රාමසාන් සමයේදී ගත යුතු පියවර




සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්

විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.